# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.11.12 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/2037/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. කොටහේන ප්‍රදේශයේදී වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ දිසා අපරාධ කොට්ඨාසය.**

2025.11.07 වන දින කොටහේන පොලිස් වසමේ 16 වන පටුමග ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධය සම්බන්ධයෙන් කොළඹ දිසා අපරාධ කොට්ඨාසය හා යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් වැඩිදුර විමර්ශන ආරම්භ කර තිබිණි.

ඒ අනුව, 2025.11.10 වන දින මෙම ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් මගින් අත්අඩංගුවට ගෙන කොළඹ දිසා අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස වුරුදු 29 ක් වන මානිප්පායි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු හට රැඳවුම් නියෝග යටතේ රඳවා තබාගනිමින් කොළඹ දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - හසලක පොලිස් වසම.**

හසලක පොලිස් වසමේ හිඹුටුව ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු 2025.11.10 වන දින සිට අතුරුදන්ව ඇති බවට 2025.11.11 වන දින උදෑසන කාලයේ හසලක පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර තිබිණි. ඒ අනුව, අතුරුදන් පුද්ගලයාගේ මෘත ශරීරය මිනිපේ යෝධ ඇලේ 28 ඇලේ වැවේ තිබී සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 67 ක් වූ හිඹුටුව, බරවර්ධනඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මහියංගනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හසලක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - තඹුත්තේගම පොලිස් වසම.**

2025.11.11 වන දින උදෑසන කාලයේ තඹුත්තේගම පොලිස් වසමේ තඹුත්තේගම 27 හන්දිය මාර්ගයේ ලුණුවැව ප්‍රදේශයේදී තඹුත්තේගම දෙස සිට නොච්චියාගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඊට ඉදිරියෙන් එම දිශාවට ධාවනය වූ ලොරි

රථයකට ඉස්සර කිරිමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි පුද්ගලික බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු තුවාල ලබා ප්‍රතිකාර සඳහා තඹුත්තේගම රෝහලට ඇතුලත් කිරීමේදී පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ රලපනාව ජනපදය, නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තඹුත්තේගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තඹුත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - කහවත්ත පොලිස් වසම.

2025.11.11 වන දින උදෑසන කාලයේ කහවත්ත පොලිස් වසමේ මාකදුර සිට මාදම්පේ හන්දිය හරහා කහවත්ත දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක ගමන් කල මගී කාන්තාවක් පැපොල්ඇල්ල ප්‍රදේශයේදී ධාවනය වෙමින් තිබූ බස් රථයෙන් බැසීමට යාමේදී ඇදවැටී එම බස් රථයටම යටවී අනතුරක් සිදුව ඇත. අනතුරින් මගී කාන්තාව එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 68 ක් වූ මාකදුර සබර, කහවත්ත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරික්ෂණය කහවත්ත රෝහලේදී සිදු කර ඥාතීන් වෙත භාර දී ඇති අතර බස් රථයේ රියදුරු හා කොන්දොස්තරවරයා අත්අඩංගුවට ගෙන ඇත. කහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - සිරිපුර පොලිස් වසම.

2025.11.11 වන දින උදෑසන කාලයේ සිරිපුර පොලිස් වසමේ සිරිපුර නුවරගල මාර්ගයේ පලු දෙනිය ප්‍රදේශයේදී සිරිපුර දෙස සිට පලුදෙනිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී ඊට පිටුපසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකාරිය හා යතුරුපැදිකරු දෙහිඅත්තකණ්ඩිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී යතුරුපැදිකාරිය මියගොස් ඇත. යතුරුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා පොලොන්නරුව රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකාරිය වයස අවුරුදු 54 ක් වූ පලුදෙනිය, සිරිපුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය දෙහිඅත්තකණ්ඩිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - කොකාවැව පොලිස් වසම.

2025.11.11 වන දින සවස් කාලයේ කොකාවැව පොලිස් වසමේ කිවුලේකඩ මාර්ගයේ කොකාවැව ප්‍රදේශයේදී කොකාවැව හන්දිය දෙස සිට කිවුලේකඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයට වැටී තිබූ ගසක අත්තක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු ගලෙන්බිඳුණුවැව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ ඉහලබොරලුගොඩැල්ල, කොකාවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගලෙන්බිඳුණුවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොකාවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - මාතර පොලිස් වසම.

2025.11.11 වන දින උදෑසන කාලයේ මාතර පොලිස් වසමේ වෙලේවත්ත නාවිමන මාර්ගයේ බෙලිගස් හන්දිය ප්‍රදේශයේදී නාවිමන දෙස සිට වෙලේවත්ත දෙසට ධාවනය කල ත්‍රීරෝද රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු හා යතුරුපැදිකරු මාතර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 82 ක් වූ මාලගොඩ, නාවිමන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**